# ගුණාත්මක පර්යේෂණ

- වැවල ධම්මාලෝක හිමි

## ප්‍රවේශය

පර්යේෂණ ක්‍රම මූලික වශයෙන් වර්ග දෙකක් යටතේ සාකච්ඡා කරනු ලැබේ. එනම්, ප්‍රමාණාත්මක පර්යේෂණ සහ ගුණාත්මක පර්යේෂණ වශයෙනි. ගුණාත්මක පර්යේෂණ යනු රැස්කරනු ලබන සංඛ්‍යාත්මක නොවන දත්ත නිරීක්ෂණය කිරීමේ විද්‍යාත්මක ක්‍රමයකි. ගුණාත්මක පර්යේෂණ විවෘත-ආන්තික සහ සංවාදාත්මක සන්නිවේදනය මගින් දත්ත ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කෙරෙන වෙළඳපොල පර්යේෂණ ක්‍රමයක් වශයෙන් නිර්වචනය කෙරේ. මෙම ක්‍රමයේ දී මිනිසුන් සිතන්නේ 'කුමක් ද?' යන්න ගැන පමණක් නොව එසේ සිතන්නේ 'ඇයි?' යන්න ගැන විමසා බලනු ලැබේ. ගුණාත්මක පර්යේෂණ සඳහා අදාළ කර ගනු ලබන්නේ අර්ථ, සංකල්ප, නිර්වචන, ගතිගුණ, රූපක, සංකේත සහ දේවල් පිළිබඳ විග්‍රහ ආදිය යි. කිසියම් ප්‍රපංචයක් සිදු වන්නේ ඇයි සහ කෙසේ ද යන්නට පිළිතුරක් දීමේදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමය භාවිත කිරීම වැදගත් වේ. එහෙත් මෙහි දී ප්‍රපංචයේ සිදුවීම් වාර ගණන පිළිබඳ අවධානයට යොමු නොකෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රම බහුල වශයෙන් අධ්‍යාපනික ශික්ෂණයන්හි දී භාවිත කරනු ලැබේ. විශේෂයෙන් සමාජ සංකල්ප සහ සමාජීය විද්‍යා සම්බන්ධ පර්යේෂණ ක්‍රමයක් ලෙස මෙය යොදා ගැනේ. මීට අමතර ව අධ්‍යාපනික වශයෙන් අගයක් නොමැති වෙළඳපළ සමීක්ෂණ, ව්‍යාපාර, ජනමාධ්‍ය සහ සේවා ක්ෂේත්‍රවල දී ද ගුණාත්මක පර්යේෂණ ක්‍රම භාවිත කරනු ලැබේ. රචනාවේ අරමුණ වන්නේ සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර ශික්ෂණ ධාරාවන් තුළ බහුලව භාවිත කෙරෙන ගුණාත්මක පර්යේෂණ ක්‍රමය සහ එහි භාවිත වන දත්ත රැස්කිරීම හා විශ්ලේෂණ කිරීමේ ක්‍රමය පිළිබඳ හැඳින්වීමක් කිරීමයි. ගුණාත්මක පර්යේෂණ යනු විශාල හා සංකීර්ණ ක්‍රමවිද්‍යාවකි. ගුණාත්මක පර්යේෂණ පිළිබඳ අදහසක් ඇති කිරීම සහ ගුණාත්මක පර්යේෂණ දත්ත, ප්‍රවේශයන් සහ ක්‍රමවේද පිළිබඳ විද්‍යාර්ථීන් තුළ නැඹුරුවක් ඇති කිරීම වැදගත් ය.

## ගුණාත්මක පර්යේෂණවල මූලික ලක්ෂණ

ගුණාත්මක පර්යේෂණවල විශේෂත්වය හඳුනා ගත හැකි වන්නේ එහි භාවිත කෙරෙන දත්ත සහ ඒවා නිරීක්ෂණය කෙරෙන පුද්ගලයාගේ ස්වභාවය විමසා බැලීමෙනි. පර්යේෂණ ක්‍රමය මූලික වශයෙන් ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් බෙදා දක්වනු ලබන්නේ ද ඒවා තුළ භාවිත කෙරෙන දත්තවල විවිධත්වය නිසාය. දත්ත යනු පර්යේෂණය සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයි. පර්යේෂණය සඳහා භාවිත කරනු ලබන දත්ත මූලික ආකාර දෙකකට බෙදා දැක්විය හැකිය. ඒ ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක දත්ත යනුවෙනි. සංඛ්‍යානමය ආකාරයෙන් භාවිත කළ හැකි දත්ත ප්‍රමාණාත්මක දත්ත වන අතර එසේ නොවන ඒවා ගුණාත්මක දත්ත ලෙස සැලකේ. එහෙත් ආධුනිකයා ගුණාත්මක දත්ත යනු වචන හා පෙළ ආදිය පමණක් නොවන බව සැලකිය යුතු ය. ඡායාරූප, චිත්‍රපට, පටිගත කළ ශබ්ද ආදී දෑ ද පර්යේෂණයේ ගුණාත්මක දත්ත වශයෙන් රැස් කරනු ලැබේ.

ගුණාත්මක දත්ත සහ ප්‍රමාණාත්මක දත්ත අතර උපයෝගිතාවේ වෙනස්කම් ඇතත් ඒ දෙක පැහැදිලි ව වෙන් කර හඳුනා ගැනීම අපහසු වේ. ප්‍රමාණාත්මක දත්ත පිළිබඳ පර්යේෂකයන් පවසන්නේ ඔවුන්ගේ දත්ත දෘඪ, අනම්‍ය, විශ්වසනීය සහ විද්‍යාත්මක වන බව යි. ගුණාත්මක පර්යේෂකයෝ ඔවුන්ගේ දත්ත සංවේදී, සියුම් වෙනස්කම් ඇති, විස්තරාත්මක සහ සන්දර්භානුගත වන්නේ යැයි පවසති. දත්ත වර්ග දෙක එකිනෙකට වඩා උසස් කොට සලකා බැලීමට මෙකී තර්ක හේතු වී තිබේ. මෙවැනි අන්තගාමී තර්ක විතර්ක සමාජීය විද්‍යා පර්යේෂණ වල පදනම් වී ඇත්තේ ගුණාත්මක විචාර බුද්ධිය මත යි. එසේ ම සියලු ම ගුණාත්මක දත්ත සංඛ්‍යාත්මක ව මැනීම හා විග්‍රහ කිරීම කළ හැකි ය. සියලු ම ගුණාත්මක තොරතුරු පහසුවෙන් ප්‍රමාණාත්මක දත්ත බවට හැරවීමේ හැකියාව පවතී. මේ ආකාරයෙන් ගුණාත්මක තොරතුරු ප්‍රමාණාත්මක භාවයට හැරවීමෙන් පර්යේෂකයාට ඔහුගේ පර්යේෂණයේ වටිනාකම ඉහළ නැංවිය හැකි වේ. මේ සඳහා ඇති සරල ම ක්‍රමය වන්නේ ප්‍රමාණාත්මක තොරතුරු ඒකකවලට බෙදා ඒවා සංඛ්‍යා වශයෙන් ඉදිරිපත් කිරීම යි. එම

සරල නාමික සංඛ්‍යාකරණයන් පර්යේෂකයාට ඉතා පහසුවෙන් හා කාර්යක්‍ෂම ව ඔහුගේ ගුණාත්මක තොරතුරු සංවිධානය කිරීමට හා පිරිසැකසුම් කිරීමට උපකාර වේ.

ගුණාත්මක දත්ත හා ප්‍රමාණාත්මක දත්ත පිළිබඳ පෙන්වන වෙනස්කම් තරමක් නුසුදුසු බව පෙනේ. බොහෝ විට දක්වනු ලබන වෙනස්කම් අනුව ගුණාත්මක දත්ත වචනවලින් සමන්විත වන අතර ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යාවන් වේ. එහෙත් මෙය මූලික ලක්‍ෂණයක් ද යන්න විමසිය යුතු ය. ඊට එක් හේතුවක් වන්නේ සියලු ම ගුණාත්මක දත්ත ප්‍රමාණාත්මක ව කේතකරණය කළ හැකි වීමයි. ඉන් සරල ව අදහස් කෙරෙන්නේ ගුණාත්මක ඕනෑ ම දෙයකයට අර්ථවත් සංඛ්‍යානමය වටිනාකම් පැවරිය හැකි බව යි. මෙම වටිනාකම් මෙහෙයවා අපට දත්තවල අර්ථවත් බව කෙරෙහි ගැඹුරු දැක්මක් හෙළීමට හැකි අතර විශේෂිත උපන්‍යාසයන් විභාග කිරීමට හැකි වේ. අනෙක් අතට සියලු ම ප්‍රමාණාත්මක දත්ත පදනම් වී ඇත්තේ ගුණාත්මක තීරණ මතයි. සංඛ්‍යා ඒවායින් ම අර්ථකථනය කළ නොහැකිය. සංඛ්‍යා විග්‍රහ කළ හැක්කේ ඒවායේ යටින් ඇති කල්පිතයන් තේරුම් ගැනීමෙනි.

ගුණාත්මක පර්යේෂණවල කැපී පෙනෙන ලක්‍ෂණ කීපයක් පෙන්වා දී තිබේ (ජයසේන සහ ඇම්බැක්ක, 2015: 44-47).

1. අර්ථය යන සංකල්පයට වැදගත් තැනක් හිමිවීම.
2. සෑම අර්ථවත් සිද්ධියක්ම හැකිතාක් දුරට එහි ස්වභාවික සන්දර්භය තුළ අධ්‍යයන කිරීම.
3. පර්යේෂකයාට වැදගත් තැනක් හිමි වීම හෙවත් අර්ථනිරූපණය කරන වේදකයෙකු වීම ආදී වශයෙනි.

**ගුණාත්මක මැනීම්වල වටිනාකම**

ගුණාත්මක පර්යේෂණ සිදු කිරීමට ප්‍රධාන හේතුව වන්නේ පර්යේෂකයා රුචිකරන ප්‍රපංචයක් පිළිබඳ වැඩි වැඩියෙන් ලබන අද්දැකීම් සමුදාය යි. මේ සඳහා බොහෝ විට උපාධි අපේක්‍ෂකයින්

ඔවුන්ගේ පර්යේෂණ යෝජනා සැකසීමේ දී සිදු කරන්නා සේ හුදෙක් සාහිත්‍ය ගවේෂණය හා පොත් පත් කියවීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔවුන් විසින් ප්‍රපංචය හෝ සංසිද්ධිය පිළිබඳ ඍජු අද්දැකීම් ලැබීම ද ඉතා වැදගත් ය. එසේ ම සංකීර්ණ සහ සංවේදී කරුණු විභාග කිරීමට ගුණාත්මක පර්යේෂණ ඉතා සුදුසු ය. නිදසුනක් ලෙස දෙවියන් හා ආගම, මිනිසාගේ ලිංගිකත්වය, මරණ දඬුවම, මත්ද්‍රව්‍ය භාවිතය වැනි මාතෘකා ගත හැකි ය. එ වැනි මාතෘකා විභාග කිරීම සඳහා ප්‍රමාණාත්මක ක්‍රම භාවිත කිරීමෙන් ලද හැකි ප්‍රතිඵල සීමා සහිත ය.

ප්‍රපංචයක් හෝ සංසිද්ධියක් පිළිබඳ ඉතා විස්තරාත්මක ව තොරතුරු ගොඩනැගීමේ දී ගුණාත්මක පර්යේෂණ විශිෂ්ට වේ. සමහර අවස්ථාවල ඉතා විශාල සංඛ්‍යාත්මක දත්ත එක්රැස් කරනු ලබන ප්‍රමාණාත්මක පර්යේෂණ ද සිදු වේ. එහෙත් මෙවැනි විස්තර සහිත ප්‍රමාණාත්මක පර්යේෂණ තුළ දත්ත විශ්ලේෂණයේ දී සහ සංවිධානය කිරීමේ දී සීමා සහිත බවට පැමිණේ. ගුණාත්මක පර්යේෂණ තුළ දෙවල් ඉතා සරල ලෙස සලකා බලන්නේ නැත. එක් රැස් කෙරෙන දත්ත පිළියෙල නොකළ ඒවා වන අතර කලාතුරකින් කලින් සංවිධානය කරන ලද ඒවා විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස පර්යේෂකයාට අමු දත්ත සියල්ල සංවිධානය කිරීමට සිදු වේ. මෙසේ දත්ත සංවිධානය කිරීමට යොදා ගත හැකි ක්‍රම සීමාවක් නැත. උදාහරණයක් ලෙස සම්මුඛ සාකච්ඡාවක් හෝ ලේඛන ප්‍රමාණයක් හෝ පිළිබඳ නියැදියක් සංවිධානය කිරීම වුවත් වෙහෙසකර කාර්යයක් විය හැකි ය.

ප්‍රමාණාත්මක පර්යේෂණවල ඇති විස්තරාත්මක ස්වරූපය තුළ හොඳ නරක දෙක ම අන්තර්ගත වේ. යහපත් පක්ෂය වන්නේ එහි දී කිසියම් ප්‍රපංචයක්, පර්යේෂණයට සහභාගීවූවන්ගේ භාෂාවෙන් ම කැමැති පරිදි විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව යි. සමහර ඉතා හොඳ ගුණාත්මක පර්යේෂණ ග්‍රන්ථ ස්වරූපයෙන් ප්‍රකාශයට පත් වන අතර ඒවා ආඛ්‍යානමය කතා ස්වරූපයෙන් ද තිබිය හැකි ය. මේවායේ තොරතුරු සහාගිකරුවන්ගේ ඍජු විස්තර සහ දීර්ඝ සම්මුඛ සාකච්ඡා ආදිය සංස්කරණය කර ආඛ්‍යාන ස්වරූපයෙන් දක්වනු ලැබේ. මෙහි අයහපත් පක්ෂය වන්නේ එවැනි සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් මගින් තේමාවේ සාධාරණීකරණයක් හෝ පොදු බවක් ඇති

කළ හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ ඇති වන ගැටලුව යි. මෙහි දී බොහෝ ගුණාත්මක පර්යේෂකයෝ සාධාරණීකරණය කිරීම පිළිබඳ එතරම් අවධානයක් යොමු නොකරන අතර ඔවුන්ගේ ප්‍රපංච පිළිබඳ විස්තර කිරීම් බහුල කිරීමෙන් සෑහීමට පත් වෙති.

ඉහත හේතු නිසා ගුණාත්මක පර්යේෂණවල දී ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම ද මිශ්‍ර කර ගැනීම ඉතා වැදගත් වන බව පෙන්වා දී තිබේ. සංඛ්‍යානමය ප්‍රක්ෂේපණ මත පදනම් වී විශාල දත්ත ප්‍රමාණයක් සාරාංශකරණය කොට සාමාන්‍යකරණය වෙත එළැඹීම ප්‍රමාණාත්මක පර්යේෂණවල දී උසස් ලෙස සිදු වේ. මානවීය සන්දර්භයක් තුළට ගුණාත්මක ප්‍රතිඵල ප්‍රමාණයක් ප්‍රදානය කරමින්, සවිස්තරාත්මක භාවයකින් සහ සහභාගිකරුවන්ගේ දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් කරනු ලබන ව්‍යාඛ්‍යාන ක්‍රමයක දී ගුණාත්මක පර්යේෂණය ඉතා ප්‍රයෝජන වත් වේ.

**ගුණාත්මක පර්යේෂණවල සප්‍රමාණතාව**

දාර්ශනික දෘෂ්ටි කෝණයකින් බැලීමේ දී සමහර ගුණාත්මක පර්යේෂකයෝ සප්‍රමාණතාව පිළිබඳ රාමුව ප්‍රතික්ෂේප කරති. ඔවුන් පවසන්නේ සමාජීය විද්‍යා තුළ සිදු කෙරෙන ගුණාත්මක පර්යේෂණවල පොදුවේ පිළිගත හැකි සප්‍රමාණතාවක් නොමැති බව යි. ඔවුහු අපගේ සංවේදනාවන්ට බාහිර ව යථාර්ථයක් පවත්නේ ය යන මූලික පිළිග ැනීම ප්‍රතික්ෂේප කරති. එහි ප්‍රතිඵලයක් ලෙස, බාහිර යථාර්ථයකට අයත් වූ නිරීක්ෂණ කළ හැකි සත්‍යයක් හෝ අසත්‍යය පිළිබඳ අදහස ප්‍රතික්ෂේප වේ. ඒ අනුව සප්‍රමාණතාව පිළිබඳ මූලික අදහස ප්‍රතික්ෂේප කෙරේ. පර්යේෂණයේ ගුණාත්මකභාවය කෙරෙහි විවිධ ප්‍රමිති මත පිහිටා තර්ක කිරීම ගුණාත්මක පර්යේෂකයාගේ කාර්යය වේ. ගුණාත්මක පර්යේෂණයේ සප්‍රමාණතාව තීරණය කෙරෙන නිර්ණායක කීහිපයකි. විශ්වසනීයත්වය, සංක්‍රාම්‍යතාව, නොවරදින බව සහ තහවුරු කිරීමේ හැකියාව යන ඒවා එම නිර්ණායක වේ.

ගුණාත්මක පර්යේෂණයේ ප්‍රතිඵල පිළිබඳ විශ්වසනීයත්වය (Credibility) හෙවත් විශ්වාස කළ හැකි බව නමැති නිර්ණායකය භාවිත කරනු ලබන්නේ පර්යේෂණ සහභාගිත්වයේ දෘෂ්ටි කෝෂණයෙනි. මේ දෘෂ්ටිය නිසා ගුණාත්මක පර්යේෂණයේ අරමුණ වන්නේ සහභාගි

වන්නාගේ ඇසින් අදාළ ප්‍රපංචය විස්තර කිරීම සහ අවබෝධ කිරීම යි. එහි දී සහභාගිකරුවන් විසින් ම නියමානුකූලව පර්යේෂණ ප්‍රතිඵල විනිශ්චය කෙරෙයි.

සංක්‍රාම්‍යතාව (Transferability) යනු ගුණාත්මක පර්යේෂණයේ ප්‍රතිඵල වෙනත් සන්දර්භයක් හෝ පසුතලයක් වෙතට සාමාන්‍යකරණය කිරීම හෝ ආරෝපකරනය කිරීමේ හැකියාවේ ප්‍රමාණය යි. ගුණාත්මක පර්යේෂණ දෘෂ්ටිය අනුව සංක්‍රාම්‍යතාව මූලික වශයෙන් ම සාමාන්‍යකරණය කරන්නාගේ වගකීමකි. ගුණාත්මක පර්යේෂකයාට පර්යේෂණයට කේන්ද්‍ර වී ඇති පර්යේෂණ සන්දර්භය සහ උපකල්පිත විග්‍රහ කිරීමේ කාර්යය මගින් එහි සංක්‍රාම්‍යතාව වැඩි කළ හැකි ය. ප්‍රතිඵල වෙනත් සන්දර්භයකට ආරෝපණය කිරීමට පුද්ගලයා අදහස් කරන්නේ නම් එවිට ආරෝපණය කිරීම කෙතරම් සංවේදීතාවක් දක්වන්නේ ද යන්න ගැන තීරණය කිරීම පිළිබඳ ඔහු විසින් වගකිව යුතු ය.

විශ්වසනීයත්වය (Reliability) පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රමාණාත්මක දෘෂ්ටිය පදනම් වී ඇත්තේ අනුරූපකරණය හෙවත් නැවත නැවත සිදු කිරීමේ හැකියාව පිළිබඳ උපකල්පනය මත යි. මෙයින් අදහස් කරනු ලබන්නේ අවශ්‍යයෙන් ම පර්යේණයේ දී එක ම ප්‍රතිඵලය දෙවරක් නිරීක්ෂණය කළ හැකි බව යි. එහෙත් සැබවින් ම එක ම දෙයක් දෙවරක් මැනීම කළ නොහැක. මක් නිසා ද දෙවරක් මැනීම යන්න අප නිර්වචනය කරන්නේ නම්, අප අවස්ථා දෙකක් තුළ මැනීම කරන්නේ නම් ඒ වෙනස් දේවල් දෙකකි. එක ම දෙයක් නොවේ. මේ ආකාරයෙන් විශ්වසනීයත්වය තක්සේරු කිරීම සඳහා ගුණාත්මක පර්යේෂකයෝ "true score theory" වැනි උපන්‍යාසීය කල්පිත ගොඩනංවති. එම න්‍යාය සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණවල විශ්වසනීයත්වය පරීක්ෂා කෙරන මිනුම් ක්‍රමයකි. තවත් අතකින් විශ්වසනීයත්වය යන අදහසින් අවධාරණය කෙරෙන්නේ සැම විට වෙනස් වන සන්දර්භය යටතේ පර්යේෂකයා විසින් ඔහුගේ පර්යේණයට වගකිව යුතු වන බව යි. පසුතලයේ සිදුවන වෙනස්කම් සහ එම වෙනස්කම් අධ්‍යයනට කෙසේ බලපාන්නේ ද යන්න පිළිබඳ විස්තර කිරීම පර්යේෂකයාගේ වගකීම යි.

ගුණාත්මක පර්යෙෂණවල යෙදෙන්නෝ ඔවුන් සැම කෙනෙක් ම තමන්ගේ අධ්‍යයනය තුළට අද්විතීය පර්යාවලෝකයක් රැගෙන එන්නේ යැයි සිතති.

තහවුරු කිරීමේ හැකියාව (Confirmability) යනුවෙන් අදහස් කෙරෙන්නේ වෙනත් අය විසින් පර්යේෂණ ප්‍රතිඵල තහවුරු කළ හැකි හෝ සනාථ කිරීමේ මට්ටම යි. තහවුරුකරණයේ මට්ටම වැඩිකිරීම සඳහා උපාය මාර්ග ගණනාවක් ඇත. ඒ අනුව පර්යේෂකයාට තමන් අධ්‍යයනය පුරා දත්ත පරීක්‍ෂා කිරීම හා යළි-පරීක්‍ෂා කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා පරිපාටිය ලේඛන ගත කළ හැකි ය. තවත් පර්යේෂකයෙක් ප්‍රතිඵල සම්බන්ධව 'devil's advocate. නම් භූමිකාව අනුගමනය කර එම ක්‍රියා පරිපාටිය ලේඛන ගත කරයි. මෙහි දී විචාරකයා හේතුව හා තත්ත්වයන්ට විරුද්ධ ව තර්ක ඉදිරිපත් කරනු ලබන්නේ විරුද්ධවාදීකම් පාන්නෙක් ලෙස නොව හුදෙක් පර්යේෂණයේ සප්‍රමාණතාව හෙවත් වලංගුතාව නිශ්චය කරගැනීමේ තර්ක කිරීමක් වශයෙනි. පර්යේෂකයාට විරුද්ධවාදීකම් පෑ හැකි පූර්ව නිරීක්‍ෂණ එනම් ඍණාත්මක සංසිද්ධි (negative instances) සක්‍රීයව පරික්‍ෂා කිරීම සහ විස්තර කිරීම කළ හැකි ය. එසේ ම ඔහුගේ අධ්‍යයනයෙන් පසු කෙනෙකුට දත්ත විගණනයක් (data audit) සිදු කළ හැකිය. එමගින් දත්ත එකතුව සහ දත්ත විශ්ලේෂණ ක්‍රමය විභාග කිරීම කළ හැකි අතර අගතීන්ට සහ අපරූපණයන්ට ඇති සම්භාවිතාවන් පිළිබඳ තීරණයන් ඉදිරිපත් කළ හැකි ය.

**ගුණාත්මක පර්යේෂණයේ අරමුණු**

ගුණාත්මක පර්යේෂණවල අරමුණ ශික්‍ෂණයේ පසුබිම මත වෙනස් වේ. මානව චර්යාවන් ගැඹුරින් අවබෝධ කර ගැනීම සඳහා මනෝවිද්‍යාත්මක සාධක අනාවරණය කිරීම එක් ප්‍රධාන අරමුණකි. මානව අද්දැකීම් විග්‍රහකර ගැනීමේ දී ඇයි සහ කෙසේ ද යන ගැටලු පිළිබඳ පරීක්‍ෂා කිරීමට මෙම පර්යේෂණ ක්‍රමය වැදගත් වේ. මේ අනුව සමාජවිද්‍යාව, ආණ්ඩුකරණය, දේශපාන විද්‍යාව, සමාජ සේවා, අධ්‍යාපනය යනාදී ශික්‍ෂණ තුළ බහුල වශයෙන් මෙම විධික්‍රමය බහුල ව භාවිත කෙරේ.

සාම්ප්‍රදායික දැක්ම අනුව සංඛ්‍යාන විද්‍යාඥයින් පවසන්නේ ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයෙන් සිදු කරනු ලබන්නේ විශේෂිත සිද්ධි අධ්‍යයනයක් පිළිබඳ විග්‍රහයක් සිදු කිරීම පමණක් බව යි. මක් නිසා ද යත් මෙහි දී සංඛ්‍යානමය න්‍යායක් මත පිහිටා පොදු ප්‍රස්තුත උපදවා ගැනීමක් සිදු නොකෙරේ. අධ්‍යයන සන්දර්භයෙන් ඔබ්බට ගොස් ඉදිරිපත් කරනු ලබන ඕනෑ ම පොදු නිගමනයක් මෙහි දී සැලකෙන්නේ තාවකාලික ප්‍රස්තුතයක් වශයෙනි. ඒ අනුව ගුණාත්මක පර්යේෂණවල දී ඉදිරිපත් කරනු ලබන ප්‍රස්තුත ශක්තිමත් නොවන අතර ඒවා තව දුරටත් ප්‍රමාණාත්මක පරීක්ෂණ මගින් සාධනයක කළ යුතු බව ඔවුහු පවසති. එබැවින් ඔවුහු ගුණාත්මක විධික්‍රමයේ එවැනි උපන්‍යාස තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා ගණිතමය සාධක සහ ප්‍රමාණීකරණයන් අවශ්‍ය බව පෙන්වා දෙති.

එහෙත් ගුණාත්මක පර්යේෂකයා තර්ක ගොඩනගනු ලබන්නේ සමස්ත සිද්ධි අවස්ථාව මුළුමනින් අධ්‍යයන කර එයින් ඉස්මතු වන ප්‍රපංච, අවස්ථා පිළිබඳ අවබෝධය මත යි. එහි දී ඔහු සංඛ්‍යානමය නොවන ආකාරයේ දෘඪ දත්ත විශාල ප්‍රමාණයකට ප්‍රවේශයක් ඇති කර ගනී. එම පර්යේෂණය ප්‍රපංචය පිළිබඳ පූර්ව අවබෝධයක් නොමැතිව (grounded theory) ආරම්භ විය හැකිය. එසේත් නැතිනම් එම අධ්‍යයනය ප්‍රස්තුතවලින් පටන් ගෙන විද්‍යාත්මක සහ ආනුභවික ආකාරයකින් පර්යේෂණය ඉදිරියට පවත්වාගෙන ගිය හැකි ය.

**ගුණාත්මක පර්යේෂණ හා ප්‍රමාණාත්මක පර්යේෂණ අතර වෙනස්කම්**

ගුණාත්මක පර්යේෂණ ආකාර කීපයකින් ප්‍රමාණාත්මක පර්යේෂණයට වඩා වෙනස් වේ. මූලික වශයෙන් ඒවා වෙනස් වන්නේ ගැටලුව විසඳීමට ගනු ලබන ප්‍රවේශයන් මත යි. විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා දාර්ශනික ව ලෝකය දෙස බලන ආකාරය සහ භාවිත කෙරෙන විවිධ ක්‍රමවේද සහ නිර්මිත අනුව මේ වෙනස්කම් ඇති වී තිබේ.

**1. පර්යේෂණයේ නාභිගත කිරීම:**

ගුණාත්මක පර්යේෂණයේ දී අද්දැකීම්වල ගුණාත්මක භාවය දෙසට පර්යේෂණයේ නාභිගත කිරීම යොමු වේ. එමගින් මානව

අද්දැකීම්වල සාරය හෝ ස්වභාවය විස්තර කිරීමට හෝ අවබෝධකර ගැනීමට උත්සාහ දරනු ලැබේ. එහි දී ඇයි ? කුමක් ද ? කුමක් නිසා ද? ආදී ප්‍රශ්න අසනු ලබන අතර ඒවාට විස්තරාත්මක පිළිතුරු දීම සිදු වේ. අනෙක් අතට ප්‍රමාණාත්මක පර්යේෂණයේ දී නාභිගත කෙරෙන්නේ බෙහෙවින් ප්‍රමාණාත්මක ව මැනිය හැකි සාධක ය. එමගින් සංසිද්ධිය පිළිබඳ කොපමණ ද?, කීයක් ද? කොපමණ වතාවක් ද? ආදී ප්‍රශ්න අසමින් දත්ත රැස් කෙරේ. එවැනි ප්‍රශ්නවලට සංඛ්‍යාත්මක පිළිතුරු ලැබේ.

### 2. දාර්ශනික මූලයන්

ගුණාත්මක පර්යේෂණයේ දී මිනිස් අද්දැකීම් විෂයමූලික ව (subjectively) අනුකලනය කරනු ලැබේ. එහි දී බාහිර යථාර්ථය ශුද්ධ වාස්තවිකත්වයකින් (objectively) නොවිමසයි. ගුණාත්මක පර්යේෂණ අභිසංස්කරණවාදී (constructivism) හෝ අර්ථකථනවාදී (interpretivism) ගුරුකුලවලට අයත් ක්‍රමයකි. ප්‍රමාණාත්මක පර්යේෂණ පදනම් වී ඇත්තේ ප්‍රත්‍යක්ෂවාදය (positivism) මත යි. එයින් නිරීක්ෂකයාගෙන් ස්වාධීන ව පවතින භෞතිකය සහ සමාජ ප්‍රපංච කාලය හා ස්ථානය අනුව බොහෝ විට ස්ථායී වන බවත් වාස්තවික ව නිරීක්ෂණය කළ හැකි බව හා ප්‍රමාණාත්මක ව මැනිය හැකි බවත් පිළිගනු ලබයි.

### 3. පර්යේෂණයේ අරමුණු

ගුණාත්මක පර්යේෂණයේ අරමුණු වන්නේ අවබෝධ කිරීම, විස්තර කිරීම, අර්ථය සොයා ගැනීම, හෝ උපන්‍යාස හෝ න්‍යාය උත්පාද කිරීමයි. ප්‍රමාණාත්මක පර්යේෂණවල අරමුණ වන්නේ උපන්‍යාසයක් පිළිබඳ අනාවැකි කීම, පාලනය, තහවුරු කිරීම සහ විභාග කිරීම යි.

### 4. සැලසුම්වල ගතිලක්ෂණ

මෙම පර්යේෂණ වර්ග දෙකෙහි ම සැලැසුම් ඒවායේ අමුණුවලට අනුව පවතී. ගුණාත්මක පර්යේෂණ සැලසුම් ක්‍රියාත්මක

වීමේ දී හා අවශ්‍ය අවස්ථාවල දී ඉතා නම්‍යශීලි වේ. එහෙත් ප්‍රමාණාත්මක පර්යේෂණ සැලසුම් ව්‍යූහගත වන අතර පූර්ව නිශ්චය කරන ලද ඒවා වේ. ගුණාත්මක පර්යේෂණයේ නම්‍යශීලි ව්‍යූහය නිසා එහි ශික්ෂණභාවයේ අගය අඩු වන්නේවත් සැලසුම් කිරීම හා භාවිත කිරීම පහසු වන්නේවත් නැත. හොඳින් සැලසුම් කළ වටිනාකමක් සහිත බුද්ධිමත් ගුණාත්මක පර්යේෂණයක නම්‍යශීලි ව්‍යූහයක් තිබේ. එහෙත් එය සැලසුම් කිරීමේ දී හා යොදා ගැනීමේ දී, වෙනත් ඕනෑ ම මනාව සැලසුම් කළ වටිනාකමක් සහිත බුද්ධිමත් ප්‍රමාණාත්මක අධ්‍යයනක් කෙරෙහි දක්වනු ලබන සැලකිල්ල හා අවධානය යොමු කරනු ලැබේ.

## 5. දත්ත රැස් කිරීම

ගුණාත්මක පර්යේෂණය තුළ පර්යේෂකයා මූලික උපකරණය වේ. ඔහුගේ/ඇයගේ පර්යාවලෝකනය දත්ත රැස් කිරීම සහ අර්ථකථනය තුළට රැගෙන එනු ලැබේ. ප්‍රමාණාත්මක පර්යේෂණය පරීක්ෂා කිරීම්, සමීක්ෂණ හෝ නිශ්චිත ප්‍රපංචයක් ප්‍රමාණාත්මකව මැන බැලීම් සඳහා යොදා ගනු බලන වෙනත් බාහිර උපකරණ මත රඳා පවතී.

### ගුණාත්මක දත්ත වර්ග සහ ආකාරය

ගුණාත්මක පර්යේෂණය එහි අරමුණු හඹායන්නේ කෙසේ ද යන්න එහි මූලික පියවරේ පටන් ම තේරුම් ගැනීම පහසු ය. ගුණාත්මක පර්යේෂණයේ ඉලක්කය වන්නේ ගවේෂණය (explore) කිරීම යි. එහි අරමුණ රටාවන්, මාතෘකා, විශ්වාස්, අදහස් සහ ප්‍රාරම්භක ආදර්ශ ආදිය හඳුනා ගැනීම යි. මෙම ප්‍රපංච පිළිබඳ අවබෝධය ප්‍රාරම්භක අවස්ථාවේ සිට ම සිදු වන්නකි.

විග්‍රහ කිරීම (description) ගුණාත්මක පර්යේෂණයේ හදවත ලෙස සැලකේ. විග්‍රහ කිරීමේ අත්‍යවශ්‍ය ගතිලක්ෂණය වන්නේ විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීම සහ අද්දැකීම් නිවැදිව ඉදිරිපත් කරනු ලබන විශේෂිත තොරතුරුවල අවශ්‍යතාව යි.

ගුණාත්මක පර්යේෂණවල දී ගවේෂණය, විග්‍රහ කිරීම හා අර්ථකථනය ඔස්සේ විශේෂිත සන්ධර්භයක් හෝ පරිස්ථිතියක් තුළ ප්‍රපංචයක් පිළිබඳ පූර්ණ අවබෝධයක් කරා ළඟා වීමට උත්සාහ දරනු ලැබේ. සැකෙවින් කිවහොත් ගුණාත්මක පර්යේෂණවල දී සිද්ධි සහ ප්‍රපංච පිළිබඳ අර්ථකථනයන් (interpretation) නිෂ්පන්න කිරීමට උත්සාහ දරනු ලැබේ. අර්ථ විග්‍රහ මගින් පර්යේෂණයේ අරමුණු භාවිත කර අවබෝධය හෝ පැහැදිලි කිරීම වෙත ළඟා වීමට තිබෙන මාර්ග පිළිබඳ දැනීමක් ඇති කරයි.

ගුණාත්මක දත්තවල තවත් ලක්ෂණයක් වන්නේ සහභාගි වන්නන්ගේ ගැටලු ඒවා පැන නගින අවස්ථාවේ දී ම අධ්‍යයන කරමින් දත්ත රැස් කරනු ලැබීම යි. මේවා යථාකාල දත්ත (real-time data) වන අතර සමහරවිට දත්ත රැස්කිරීමට කලාතුරකින් සහභාගිවන්නා ඔහුගේ භූමියෙන් හෝ අවකාශයෙන් පිටතට ගෙන යනු ලැබේ. එසේම තවත් විශේෂත්වයක් වන්නේ විවිධත්වයකින් යුතු දත්ත රැස් කිරීමයි. තනි මූලාශ්‍රයකට සීමා නොවී සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ලේඛන ආදී විවිධ මූලාශ්‍රවලින් තොරතුරු එක් රැස් කෙරේ.

**ගුණාත්මක පර්යේෂණ ක්‍රම සම්ප්‍රදායන්**

ගුණාත්මක පර්යේෂණ යනු එක් වර්ගයක් ලෙස පෙනී ගියත් එය එසේ නොවේ. සැබැවින් ම ගුණාත්මක පර්යේෂණ ක්‍රම ගණනාවක් පවතී. ඒ අතර ජනප්‍රිය ක්‍රම පහක් පමණ ඇත. මානවවංශවිවරණ ක්‍රමය (ethnography), ආඛ්‍යාන ක්‍රමය (narrative), ප්‍රපංචවිද්‍යා ක්‍රමය (phenomenology), පදනම් න්‍යාය (grounded theory) සහ සිද්ධි අධ්‍යයනය (case study) ආදී වශයෙනි. මීට අමතර ව ඓතිහාසික පර්යේෂණ ක්‍රමය (historical research) සහ කාර්ය මූලික පර්යේෂණ ක්‍රමය (action research) ද බහුලව භාවිත වන ගුණාත්මක පර්යේෂණ ක්‍රම වේ. මෙම ක්‍රම සියල්ලෙහි ම පාහේ සමාන දත්ත රැස් කිරීමේ ක්‍රම අනුගමනය කරනු ලබයි. නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, සහ ග්‍රන්ථ විමර්ශනය වැනි ක්‍රම ඒ අතර ප්‍රමුඛ වේ. එහෙත් පර්යේෂණ ක්‍රම අනුව ඒවායේ අරමුණු විවිධ වේ.

මානව වංශ විවරණය වෘත්තීමය පර්යේෂකයන් විසින් බහුලව භාවිත කරනු ලබන ගුණාත්මක පර්යේෂණ ක්‍රමයකි. මානව

වංශ විවරණය මුල් බැස ඇත්තේ සංස්කෘතික මානවවිද්‍යාව තුළ යි (Bernard, 1995). එබැවින් පර්යේෂකයන්ට තමන්ට ම දීර්ඝ කාලයක් කිසියම් සංස්කෘතියක් තුළ බැස ගෙන පර්යේෂණවල නිරත වීමට සිදු වේ. ඔවුහු සංස්කෘතිය හෝ නිශ්චිත සන්දර්භයක් කෙරෙහි අවධානය යොමු කරති. ඔවුන්ට සම්මුඛ සාකච්ඡා සහ සමීක්ෂණ ක්‍රම මත පමණක් රැඳී සිටිය නොහැකිය. පර්යේෂකයාට දත්ත රැස් කිරීම සඳහා පළමු අවස්ථාවේ දී ම පරිසරය පිළිබඳ අද්දැකීම් ලැබීමට හා සහභාගීත්ව නිරීක්ෂයෙකු ලෙස කාලයක් ක්‍රියා කිරීමට සිදු වේ.

ආඛ්‍යාන ක්‍රමයේ දී සිදු කෙරෙන්නේ අවස්ථාවන්ගේ පිළිවෙළ හෙවත් පරම්පරාව එකට වියමන් කර දැක්වීමයි. එහි දී කිසියම් පුද්ගලයෙකු හෝ දෙදෙනෙකු සම්බන්ධ අවස්ථාවන් එකිනෙකට සම්බන්ධ වූ සංයුක්ත කතාවක් වන පරිදි ඉදිරිපත් කෙරේ. මෙවැනි අවස්ථාවක ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ලේඛන කියවීම සහ විවිධ තේමාවන් පිළිබඳ සොයා බැලීම සිදුකරනු ලබයි. මේ අධ්‍යයනවල අරමුණ වන්නේ විශාල පිරිසකට බලපෑමක් ඇතිවන පරිදි තනි පුද්ගලයෙකුගේ කතාවක් චිත්‍රණය කිරීම යි. මෙහි දී පර්යේෂකයාට සම්මුඛ සාකච්ඡා සතියක්, මාසයක් හෝ වසරක් වුව පැවැත්වීමට සිදු විය හැකිය. එහෙත් අවසානයේ දී කාලානුක්‍රමයක් අනුව ඔහු ඒවා ඉදිරිපත් නොකරයි. ඒ වෙනුවට එය තේමාවන්ගෙන් යුක්ත ව්‍යාඛ්‍යානයක් හෝ කතාන්දරයක් ලෙස ඉදිරිපත් කළ හැකි ය. එසේ ම ඒ තුළින් නවෝත්පාදනයක් සිදු වන පරිදි ගැටුම්කාරී කතා සහ ඉස්මතු වන ආතතීන් හා අභියෝග සමෝධානය කරනු ලැබේ.

ප්‍රපංචවිද්‍යා ක්‍රමය භාවිත කරනු ලබන්නේ කිසියම් අවස්ථාවක්, ක්‍රියාකාරකමක් හෝ ප්‍රපංචයක් හෙවත් සංසිද්ධියක් විග්‍රහ කිරීමට අවශ්‍ය වූ විට යි. ප්‍රපංචවිද්‍යාත්මක ක්‍රමයේ දී පර්යේෂකයාට ක්‍රම කීපයක් මිශ්‍රකර භාවිත කිරීමට සිදු වේ. සම්මුඛ සාකච්ඡා මෙහෙයවීම, ලේඛන කියවීම, වීඩියෝ දර්ශන නැරඹීම, ස්ථාන සහ අවස්ථා නැරඹීම. මෙයින් සිදු කරනු ලබන්නේ සහභාගිකරුවන් සිටින කුමන හෝ ස්ථාන පිළිබඳ අවබෝධය ඇති කර ගැනීම සඳහා ඒ ස්ථාන හා අවස්ථා විභාග කරනු ලැබීම යි. මෙහි දී පර්යේෂණයේ සහභාගි කරුවන්ගේ දෘෂ්ටිය මත රදා පවතිමින් ම ඔවුන්ගේ අභිප්‍රායන් ගැඹුරින් අවබෝධ කර ගැනීමට ක්‍රියාකරයි. ප්‍රපංචවිද්‍යාත්මක අධ්‍යයනයක දී සම්මුඛ සාකච්ඡා විශාල

ප්‍රමාණයක් පැවැත්වීමට සිදු වේ. සාමාන්‍යයෙන් එය 5 සිට 14 දක්වා විය හැකි ය. ඊට හේතුව වන්නේ පර්යේෂකයාට ඔහුගේ තේමාවන් සම්පූර්ණ වීම සහ ඔහුගේ සොයාගැනීම්වල වලංගුතාව ඇති කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත පදනමක් සකසා ගැනීමට සිදු වන බැවිනි.

ප්‍රපංචවිද්‍යාත්මක අධ්‍යයනයකින් බලාපොරොත්තු වන්නේ කිසියම් සිද්ධියක හෝ අවස්ථාවක සාරය විස්තර කිරීම වන අතර පදනම් න්‍යායෙන් බලාපොරොත්තු වන්නේ කිසියම් සිද්ධියක් පිටුපස ඇති න්‍යායක් හෝ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම යි. මෙහි දී පර්යේෂකයා දත්ත මත පදනම් වූ න්‍යායක් ගොඩනැංවීම සඳහා ප්‍රාථමික සම්මුඛ සාකච්ඡා හා දැනට පවත්නා ලේඛන භාවිත කරයි. දත්ත මත පදනම් වූ න්‍යායක් ගොඩනැංවීමට අක්‍ෂගත කේතකරණ ක්‍රියාවලිය (axial coding techniques) භාවිත කෙරේ. අක්‍ෂගත කේතකරණ ක්‍රමය යනු ගුණාත්මක දත්ත විශ්ලේෂණය තුළ භාවිත කෙරෙන මූලික තේමාවන් විභාග හෙවත් විශ්ලේෂණය කිරීමේ ක්‍රමයකි. පදනම් න්‍යාය තුළ ප්‍රවර්ග සහ සංකල්පවලට අදාළ ව නිගාමී හා උද්ගාමී තර්කන සම්බන්ධ කර ගැනීම මගින් කේතකරණය කරනු ලැබේ. මෙහි දී දත්ත රැස් කරගැනීමෙන් පසු දත්ත විශ්ලේෂණය සඳහා මූලික පියවර කීපයක් අනුගමනය කරනු ලැබේ.

### 1. පෙළ කේතකරණය කිරීම සහ එයට න්‍යායික භාවයක් ලබා දීම

මෙම ක්‍රියාවලියේ මූලික පියවර කේතකරණය නොහොත් දත්ත සංකල්පීය අවයවවලට බෙදා දැක්වීම යි. මෙහි දී සංකල්ප නාමකරණය කරනු ලැබේ. එම මූලික පද හා යෙදුම් සලකුණු කිරීම මගින් ප්‍රයෝජනවත් සංකල්ප හඳුනා ගැනෙයි. දෙවැනි පියවර වන්නේ න්‍යායික ප්‍රවේශයක් ඇති කිරීම යි. කේතකරණය කිරීමෙන් පසු නිදර්ශන උපුටා ගනු ලැබේ. සංකල්පවලට අදාළ නිදර්ශන අදාළ කර ගනිමින් එක් එක් සංකල්ප විශාල හෝ අන්තර්ගත සංකල්ප සමග සම්බන්ධතා දක්වන්නේ කෙසේ ද යන්න සිතා බැලීම මෙහි දී සිදු කෙරේ.

## 2. ස්මෘති සටහන් තැබීම හා න්‍යායික භාවය ලබාදීම

හඳුනාගනු ලබන සංකල්ප සෑම එකක් ම පිළිබඳ ලේඛන සටහන් පවත්වා ගැනීමේ ක්‍රියාවලිය මෙයින් අදහස් කෙරේ. ස්මෘති සටහන් යනු පර්යේෂකයන් සතු නිරීක්ෂණ සහ අවබෝධයන් පිළිබඳ විශාල ලේඛන එකතු ය. පර්යේෂකයාගේ පළමු සංකල්පය ඇතිවීමත් සමග ස්මෘති සටහන් ආරම්භ වේ. පොත්පත් විමර්ශනය කිරීමෙන් මේ සංකල්පය තවදුරටත් විභාග කර එයින් න්‍යායික භාවයක් ව්‍යුත්පන්න කෙරේ.

## 3. අනුකළනය, ශුද්ධිකරණය සහ ලේඛන න්‍යාය

කේතකරණය කරන ලද ප්‍රවර්ග සෑම දේ ම ආවරණය කරනු ලබන කේන්ද්‍රීය ප්‍රවර්ගයක් වටා පිහිටි න්‍යායික ආදර්ශයකට සම්බන්ධ කිරීම මෙහි අදහසයි. පදනම් න්‍යාය ඔස්සේ ඉහත පියවර ඔස්සේ දත්ත විශ්ලේෂණය කිරීමෙන් න්‍යායයන් ඉදිරිපත් කරනු ලැබේ.

සිද්ධි අධ්‍යයනය (case study) ජනප්‍රිය ගුණාත්මක පර්යේෂණයක් බවට පත් කරන ලද්දේ හාර්වඩ් ව්‍යාපාරික පාසල (Harverd Buissiness School) මගිනි. විශේෂයෙන් සිද්ධි අධ්‍යයනය මගින් සංවිධානයක්, සමාගමක්, පුද්ගලයෙක් හෝ අවස්ථාවක් පැහැදිලි කිරීම සිදු කරනු ලැබේ. යම් සිද්ධියක් අධ්‍යයන කිරීම සිද්ධි අධ්‍යයනක් ලෙස සරලව හැඳින් වේ (සේනාධීර, 2007: 113). බහුවිධ දත්ත මූලාශ්‍රයන් ඔස්සේ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම මගින් සිද්ධි අධ්‍යයනයක් සිදු කෙරේ. සිද්ධි අධ්‍යයනයක් අවස්ථාවක් පිළිබඳ ව්‍යාඛ්‍යානුරූපී (explanatory)" ගවේෂණාත්මක (exploratory) හෝ විස්තරාත්මක (describing) ආකාරයක් ගත හැකි ය. සම්මුඛ සාකච්ඡා, ලේඛන, වාර්තා සහ නිරීක්ෂණ මගින් දත්ත රැස්කරනු ලැබේ. ගුණාත්මක පර්යේෂණයේ ජනප්‍රිය විධික්‍රමය වන්නේ සිද්ධි අධ්‍යයනය යි (Stake, 1995). එනම් ප්‍රපංචයක් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා 'අර්ථවත් නියැදි' ගැඹුරින් අධ්‍යයන කිරීම යි.

අතීත සිද්ධි පිළිබඳ දත්ත විග්‍රහ කරමින් ඒවායේ අර්ථය තේරුම් ගැනීම සඳහා කරනු ලබන අධ්‍යයන ඓතිහාසික පර්යේෂණ වේ.

මෙසේ කිරීමේ දී පර්යේෂකයෝ ප්‍රාථමික ඓතිහාසික දත්ත (ඉතිහාස අවස්ථා පිළිබඳ ඍජු වාර්තා, ලේඛනාගාර දත්ත, රාජකාරී ලේඛන, පුද්ගලික ලේඛන, ඇසින් දුටුවන්ගේ වාර්තා) කෙරෙහි මූලික අවධානය යොමු කරති. එසේ ම සිද්ධි ඇසින් නොදුටු පුද්ගලයන් විසින් තබන ලද වාර්තා, තොරතුරු (උදා: පෙළ පොත්, පුවත්පත්, ශබ්දකෝෂ, විශ්වකෝෂ) ද්විතීයක මූලාශ්‍රය වශයෙන් ඔවුහු අවධානය යොමු කරති (OHSU). ඓතිහාසික පර්යේෂණ ක්‍රමය එක්තරා ආකාරයකින් මේ වන විටත් සිදු වී ඇති සිද්ධි පිළිබඳ දත්ත රැස් කිරීම සහ මේ දත්ත මත සංඛ්‍යාත්මක හෝ විස්තරාත්මක විශ්ලේෂණයන් සිදු කිරීමකි. ඓතිහාසික දත්තවල විශේෂත්වය වන්නේ, අතීතයෙන් ලබා ගන්නා දත්ත වන බැවින් ඒවා මැනීමට ක්‍රමයක් නොමැති වීම යි (allpsych). ඓතිහාසික පර්යේෂණ දත්ත බාහිර හා අභ්‍යන්තර වශයෙන් විචාරයට භාජනය කෙරේ. එනම්, බාහිර විචාරය වශයෙන් පර්යේෂකයා විසින් දත්ත මූලාශ්‍රයන්හි නිවැරදිතාව සහ වලංගුතාව තහවුරු කර ගත යුතු ය. අභ්‍යන්තර විචාරය වශයෙන් ඔහු මූලාශ්‍රවල අන්තර්ගත වන අර්ථය සොයා ගත යුතු ය. හුදෙක් කාලානුක්‍රමික පෙළගැස්මක් ඓතිහාසික පර්යේෂණයක් ලෙස නොසැලකේ. මක්නිසාද යත්, එයින් අවස්ථාවන් හෝ සිද්ධි විග්‍රයක් සිදු නොවන බැවිනි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු සඳහා ක්ෂණික සහ කාර්යක්ෂම විසඳුම් ඉදිරිපත් කිරීමට කාර්යමූල පර්යේෂණ සිදු කරනු ලැබේ. කාර්යමූල පර්යේෂණවල විශේෂත්වය වන්නේ පර්යේෂකයා සහ පර්යේෂණයට ලක් කෙරෙන පුද්ගලයා හෝ පුද්ගලයන් සමග ඍජු සම්බන්ධතාව හා ක්‍රියාකාරීත්වය යි (Hitchcok and Hughe, 1995:27). එබැවින් පර්යේෂකයා දත්ත රැස්කිරීමේ දී කිසියම් නිශ්චිත හෝ විශේෂ ක්‍රමයක් අනුගමනය නොකරයි. නිදසුනක් ලෙස ශිෂ්‍යයෙකුගේ ගැටලුවක් තේරුම් ගැනීමට ගුරුවරයාට ශිෂ්‍යයා කෙරෙහි දයානුකම්පාවෙන් කටයුතු කිරීම වැදගත් ය. එසේ ම මෙසේ දත්ත රැස්කිරීමේ දී පර්යේෂකයා පුද්ගල අනන්‍යතාව සුරැකීම හා ආචාරධර්මවලට අනුකූල වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**දත්ත රැස්කිරීමේ ක්‍රම**

ගුණාත්මක පර්යේෂණ සඳහා දත්ත රැස් කිරීමට භාවිත කරනු ලබන ක්‍රම රාශියකි. ප්‍රශ්නාවලි, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා

මේ අතර ප්‍රමුඛ වේ. අධ්‍යාපනයේ දී භාවිත කරනු ලබන සාධන පරීක්ෂණ, ආකල්ප පරීක්ෂණ, බුද්ධි පරීක්ෂණ ආදිය ද වේ. අඩු කාලයක් වැය කර අපේක්ෂකයින් විශාල ප්‍රමාණයකින් ඍජුව දත්ත එක්රැස් කිරීමේ මාධ්‍යයක් ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය වැදගත් වේ. ප්‍රශ්නාවලි ගොඩනැංවීම හා එමගින් දත්ත රැස්කිරීම විධිමත්ව කළ යුතු කාර්යයකි (ජයසූරිය,2007,81-84).

නිරීක්ෂණ ක්‍රමය තොරතුරු සහ දත්ත රැස්කිරීම සඳහා භාවිත කෙරන වෛෂයික ක්‍රමයකි. ගුණාත්මක නිරීක්ෂණය ගුණාත්මක වෙනස්කම් තුලනය කිරීමට භාවිත කෙරේ. ගුණාත්මක නිරීක්ෂණ සිදු කෙරෙන්නේ පංච ඉන්ද්‍රියන් සහ ඒවායේ ක්‍රියාකාරීත්වයන් (දර්ශනය, සුවඳ, ස්පර්ශය, රසය, ශබ්දය) ඇසුරිනි. මෙම නිරීක්ෂණයන් මැන දැක්වීම හෝ අංකනය කළ නොහැකි අතර ගතිලක්ෂණ විභාග කෙරේ. නිරීක්ෂණය ඍජු නිරීක්ෂණ හා වක්‍ර නිරීක්ෂණ වශයෙන් ආකාර දෙකකි. ඍජු නිරීක්ෂණයේ දී පර්යේෂණයට භාජනයවන්නා සමඟ හිඳිමින් ඔහුට දැනෙන සේ පර්යේෂකයා කටයුතු කරයි. වක්‍ර නිරීක්ෂණයේ දී නිරීක්ෂණයට භාජනය වන්නා තමන් නිරීක්ෂණය වන බව නොදනී. ඍජු නිරීක්ෂණයෙන් එකතු කර ගන්නා දත්තවලට වඩා වක්‍ර නිරීක්ෂණයෙන් ලබාගන්නා දත්ත වලංගුතාවෙන් හා විශ්වසනීයත්වයෙන් යුතු බව පිළිගැනේ (ජයසුරිය, 2007:87). නිරීක්ෂණයට භාජනය වන කණ්ඩායමේ සාමාජිකයෙක් බවට පත් වී පර්යේෂකයා දත්ත රැස් කරනු ලබන අවස්ථා සහභාගීත්ව නිරීක්ෂණය යි. මානව වංශ විවරණ පරීක්ෂණවල බොහෝ විට සහභාගිත්ව නිරීක්ෂණය භාවිත කෙරෙන අතර ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත විය හැකිය.

සම්මුඛ සාච්ඡා මගින් දත්ත රැස් කිරීමේ දී පර්යේෂකයාට ප්‍රශ්න ඇසීමේ දී ව්‍යුහාත්මක ව මෙන් ම නම්‍යශීලිව ද කටයුතු කළ හැකි ය. තොරතුරු ලබා ගැනීමට අපේක්ෂකයා ප්‍රයෝග කාරී ව පෙළඹවීම පර්යේෂකයාගේ දක්ෂතාව මත සිදු වේ. සම්මුඛ සාකච්ඡාවල දී පර්යේෂකයාට දත්ත ලබා ගැනීමට වැඩි කාලයක් හා ශ්‍රමයක් වැය කිරීමට සිදු වේ. එක් අයෙකු සමග කරනු ලබන එක් පුද්ගල සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රතිචාරකයාගෙන් විස්තරාත්මක ව හා ගැඹුරින් තොරතුරු ලබා ගත හැකි ය. පුද්ගලයාගේ විශ්වාස කවරේද සහ ඒවාට බලපාන සාධක කවරේද යන්න ගැන නිවැරදි තොරතුරු

මෙමගින් ලබා ගැනීමේ වාසිය ඇත. නිවැරදි ප්‍රශ්න ඇසීමෙන් දක්ෂ පර්යේෂකයාට සම්මුඛ සාකච්ඡාවේ දී අර්ථවත් දත්ත රැස් කර ගත හැකි ය. ලැබුණු තොරතුරු මත තව දුරටත් ප්‍රශ්න මෙහෙයවා තව තොරතුරු එක් රැස් කළ හැකි ය. මෙවැනි සම්මුඛ සාච්ඡාවක් පැය භාගයේ සිට පැය දෙකක් හෝ වැඩි කාලයක් පැවැත්විය හැකි ය. ගැඹුරු සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රතිචාරකයාගේ ශරීර-භාෂාව හා බාහිර ඉඟි ආදිය විමර්ශනය කළ හැකි ය.

ඉලක්කගත කණ්ඩායම් ක්‍රමය ද දත්ත රැස්කිරීම සඳහා භාවිත කළ හැකි ගුණාත්මක පර්යේෂණ ක්‍රමයකි. ඉලක්ගත කණ්ඩායමක් (focus group) සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ඉලක්ක කරගනු ලබන (6-10) සීමිත පුද්ගලයන් සංඛ්‍යාවකි. කුමක් ද? ඇයි ? කෙසේ ද? යන ප්‍රශ්න ඇසුරින් ඔවුන්ගෙන් පිළිතුරු විමසීම මෙහි ප්‍රධාන අරමුණ යි. මෙහි වාසිය වන්නේ පර්යේෂකයාට කණ්ඩායම තුළ සිටින එක් එක් පුද්ගලයා සමග පෞද්ගලික ව ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය නොවීම යි. වර්තමානයේ අන්තර්ජාල හා මාර්ගගත සමීක්ෂණවල දී පරිගණක බොත්තමක් එබීම මගින් මෙකී ක්‍රමයට ප්‍රතිචාර ලබා ගැනීම සිදු කෙරේ. වෙනත් ක්‍රම හා සසඳා බැලීමේ දී ඉලක්ක ගත ක්‍රමය වියදම් අධික යැයි සැලකේ. සංකීර්ණ ක්‍රියාවලින් පැහැදිලි කිරීමට මෙම ක්‍රමය භාවිත කළ හැකි ය.

වාර්තා තැබීම (record keeping) ද දත්ත රැස්කිරීමේ ක්‍රමයකි. දත්ත මූලාශ්‍රය වශයෙන් දැනට පවත්නා විශ්වසනීය ලේඛන සහ ඒ හා සමාන තොරතුරු භාවිත කිරීම මෙයින් අදහස් කෙරේ. නව පර්යේෂණ සඳහා පවත්නා ලේඛන හා තොරතුරු භාවිත කරනු ලැබේ. මෙය පුස්තකාලයක් භාවිත කිරීම වැනි ය. පොත් කියවීම හා විමර්ශන මූලාශ්‍රයන් පරිශීලන මගින් අදාළ දත්ත රැස්කර පර්යේෂණය සඳහා භාවිත කිරීම මෙයින් සිදු කෙරේ.

### දත්ත වාර්තා කිරීම හා විශ්ලේෂණය

ඉහත ආකාරයේ ගුණාත්මක දත්ත සංඛ්‍යාත්මක නොවන අතර ඒවා අපට තීරණ ගැනීමට හා අවබෝධය විස්තර කිරීමට උපකාර කරයි. ගුණාත්මක පර්යේෂණයේ නිගමන කරා එළැඹීම සඳහා දත්ත සාකල්‍යයෙන් විමසීම, දත්ත පොහොසත් වීම, සියුම් වෙනස්කම්

විමසා බැලීම සහ පරීක්ෂාකාරී විශ්ලේෂණය ඉතා වැදගත් වේ.

ගුණාත්මක දත්ත රැස් කිරීමට කුමන ක්‍රමයක් තෝරාගත්ත ද එහි පැහැදිලි ලක්ෂණයක් වන්නේ එයින් විශාල දත්ත ප්‍රමාණයක් උපත්පාද කිරීම යි. දත්ත එක් රැස් කිරීම මෙන් ම දත්ත වාර්තා කිරීම ද වැදගත් ය. නිදසුනක් ලෙස පුද්ගල සම්මුඛ සාකච්ඡාවකින් හෝ ඉලක්කගත කණ්ඩායම් ක්‍රමය දී එක් රැස් කර ගන්නා දත්ත අත් අකුරින් හෝ විඩියෝ/ශබ්ද පටිගත කිරීම් ආකාරයෙන් තැබීමට සිදු වේ. පටිගත කිරීම් තිබේ නම් දත්ත විශ්ලේෂණය කිරීමට පටන් ගැනීමේ දී ඒවා අත්පිටපත් කිරීමට සිදු විය හැකි ය. පැය 08-10 කාලයක් තුළ විටින් විට සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණයක් පිටපත් කිරීම සඳහා සාමාන්‍යයෙන් පිටු 20-30 අතර ප්‍රමාණයක් අවශ්‍ය වේ. ගමන් බිමන් අතර තුර ලබා ගන්නා සටහන්, ක්ෂේත්‍ර සටහන් යනාදිය මගින් පුද්ගල ප්‍රකාශන, පරිසර තත්ත්වයන්, අවාචික සාක්ෂි ආදිය වාර්තාගත කළ හැකි ය. ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගත කිරීම් ලේඛන ගතකරනු ලබන අවස්ථාවල දී එම පිටපත් සමග සසඳා බැලීමට මෙම සටහන් උපකාර කරගත යුතු ය. මෙම ක්ෂේත්‍ර සටහන් සාමාන්‍යයෙන් අවිධිමත් ය. එහෙත් ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගතකිරීම් මෙන් ඒවා ද ආරක්ෂා කළ යුතු ය.

ලිඛිත සටහන්, ශ්‍රව්‍ය-දෘශ්‍ය පටිගතකිරීම්, චිත්‍ර සහ ලේඛන ආදිය ගුණාත්මක දත්ත විශ්ලේෂණයට ලක් කෙරේ. වඩා ප්‍රසිද්ධ ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය වන්නේ පෙළ විශ්ලේෂණය යි. පෙළ විශ්ලේෂණය (text analysis) බෙහෙවින් වෙනස් ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් වන්නේ එමගින් පර්යේෂකයා අධ්‍යයනය සඳහා සහභාගීවන්නාගේ සමාජ ජීවිතය විශ්ලේෂණය කිරීම සහ වචන, ක්‍රියා ආදිය විකේතකරණය (decode) කරනු ලැබීම යි. ඡායාරූප ද අධ්‍යයන සඳහා භාවිත කරනු ලබන අතර ඒවා විශ්ලේෂණය කිරීමේ දී ඡායාරූපවල භාවිත සන්දර්භය සහ ඒවායෙන් ගම්‍යවන දෑ විශ්ලේෂණයට බඳුන් කරනු ලැබේ.

**සමාලෝචනය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමය මගින් සංකීර්ණ ගැටලු විභාග කරමින් සියලු දෙනාට පහසුවෙන් කියවා ගත හැකි සහ තේරුම් ගත

හැකි අර්ථවත් අනුමානයන් ඉදිරිපත් කරයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය සන්නිවේදන ස්වභාවයක් ගන්නා බැවින් මිනිසුන් තුළ පර්යේෂකයා පිළිබඳ විශ්වාසයක් ගොඩනැගේ. ගුණාත්මක දත්තවල විශේෂත්වය, දත්ත රැස්කරණ ආකාරය සහ විශ්ලේෂණ කිරීම පිළිබඳ දැනුම සමාජීය විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රවල පර්යේෂණවල යෙදෙන විද්‍යාර්ථීන්ගේ අධ්‍යන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ජයසූරිය, චන්ද්‍රා (2017). **අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.** සාර ප්‍රකාශන, කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ජයසේන, අශෝකා සහ ඇම්බැක්ක, සුසිලා (2015). **පර්යේෂණ ක්‍රමවිද්‍යා ප්‍රවේශය.** කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාධීර, සිල්වි සහ වනසිංහ, ශාමින්ද (2007). **පර්යේෂණ ක්‍රමවේදය.** කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

AllPsych. Historical research, chp.6.2 http://allpsych.com/reseach methods / historicalresearch/ Access: 2019.07.13

Bernard, H.R. (1995). **Research Methods in Antropology**. Second Edition, London: Saga Publication.

Education Reforms.Action seserch.Http://www.edglossary.org/action-reserch/ Access: 2019.07.13

Hitchcok, G. and Hughe, D. (1995). **Research and the Teacher** London. Routhledge. In OHSU.Hisrorical Research

http://clinfowiki.org/wilki/index.php./Historical_reserch Access:2019.07.13

Stake, R. (1995).The Art of Case Study Research. Thousands Oaks, CA: Sage.